24.07.2019



දෙවන වාර පරීක්ෂණය 2019 — 10 ශ්‍රේණිය

1. කතෝලික සභාව පැවත එන්නේ ............. යුගයේ සිට ය.
(1) ආදිපිතෘවරුන්ගේ (2) දිවැසිවරුන්ගේ
(3) අපෝස්තුලුවරුන්ගේ (4) සභා පියවරුන්ගේ

2. "හුදෙක් නුඹේම නුවණෙහි නොපිහිටා, මුළු සිතින් ..........". මෙම වගන්තිය සම්පූර්ණ කරන්න.
(1) දෙවි උතුමන් නමදින්න. (2) හිමිතුම කෙරෙහි විශ්වාසය තබන්න.
(3) දෙවිඳුන් අණ පිළිපදින්න. (4) දෙවිඳුන්ට ප්‍රශංසා කරන්න.


3. ජීවන සභා සම්ප්‍රදාය යනු,
(1) ක්‍රිස්තුන් වහන්සේ ගැන ලිඛිතව පවතින දෑ
(2) ක්‍රිස්තුන් වහන්සේ ගැන අනුමානයෙන් සොයාගත් දෑ
(3) ලේඛනගතව නැති ක්‍රිස්තුන් වහන්සේ කළ කී දෑ
(4) ලේඛනගත කිරීමට සැලසුම් කර ඇති දෑ

4. දෙවි සමිඳාණන් වහන්සේ රාත්‍රියේදී ස්වප්නයකින් සලමොන් රජ තුමාට දර්ශනය වූයේ....... දීය. මෙහි හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර වනුයේ,
(1) හෙබ්‍රෝන්හි (2) බෙතෙල්හි
(3) ගිබියෝන්හි (4) බෙයර්ෂෙබාහි

5. ලූක්තුමා සම්බන්ධ නිවැරදි කරුණ වන්නේ.
A - ඉතිහාසඥයෙකි.
B - නීතිවේදියෙකි.
C - වෛද්‍යවරයෙකි.
D - පූජකයෙකි.

(1) A, B නිවැරදිය. (2) A, C නිවැරදිය.
(3) A, D නිවැරදිය. (4) B, C නිවැරදිය.

6. එළිදරව් සාහිත්‍යයේ මෙම සංකේතවලට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,
1. සුදු .............
2. රතු .............
3. (හතර) 4............
4. (දහය) 10...........
(1) ජයග්‍රහණය. සාගතය, විශ්වය, පරිපූර්ණත්වය.
(2) ජයග්‍රහණය, යුද්ධය හා ලේ වැගිරීම, විශ්වය, පරිපූර්ණත්වය.
(3) සාගතය, යුද්ධය හා ලේ වැගිරීම, පූර්ණත්වය, ඉශ්‍රායෙල් ජනතාව.
(4) සාගතය, මරණය, පූර්ණත්වය, පරිපූර්ණත්වය.




7. මෙහි හිස්තැනට අදාළ පිළිතුර වන්නේ,
(1) ක්‍රියාකාරී ප්‍රඥාව හා එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව.
(2) රාජ්‍ය සභා ප්‍රඥාව හා එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව.
(3) සමාජශීලී ප්‍රඥාව හා රාජ්‍ය සභා ප්‍රඥාව.
(4) දේව ප්‍රඥාව හා මනුෂ්‍ය ප්‍රඥාව.


Learning Resource Center
R
De Mazenod College
Kandana

8. .................... අනුසාර කිරීමෙන් දැහැමි ජීවිතයකට යොමුවෙමු. මෙහි හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර වන්නේ,

(1) භාග්‍ය (2) දස පනත
(3) හෘද සාක්ෂිය (4) දේව පනත්

9. නිමල් එළිදරව්ව පොත ලියවුණු පීඩන සමය මෙසේ නම් කරන ලදි. මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

(1) නීරෝ අධිරාජ්‍යාගේ පීඩන සමයේ දී ය.
(2) දියොක්ලේසියානු අධිරාජ්‍යාගේ පීඩන සමයේ දී ය.
(3) අව්රේලියස් අධිරාජ්‍යාගේ පීඩන සමයේ දී ය.
(4) ඩොමීෂියන් අධිරාජ්‍යාගේ පීඩන සමයේ දී ය.

10. ධනය බලය නොව විනිශ්චය තෝරා ගැනීමට ඥානය ඉල්ලූ රජ වන්නේ,

(1) සාවුල් රජ (2) සලමොන් රජ
(3) හෙරෝද් රජ (4) දාවිත් රජ

11. රූත් කථාව සහ එස්තර් පොත් .................... කෘති දෙකකි. මෙහි හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර වන්නේ,

(1) ජනප්‍රිය ද්වැසි (2) ජනප්‍රිය වීර
(3) ජනප්‍රිය ඓතිහාසික (4) ජනප්‍රිය ධාර්මික

12 ආඥාපත්කව කටයුතු කිරීම යනු,

(1) හෘද සාක්ෂියට අනුව ජීවත් වීමයි.
(2) වඩා පහසු දේ කිරීමයි.
(3) ආඥාපත්‍ර පමණක් තෝරාගෙන කටයුතු කිරීමයි.
(4) බුද්ධිය මෙහෙයවා කටයුතු කිරීමයි.

13. ඉරුදින දිව්‍ය පූජාවේ දෙවන කියවීම සඳහා බොහෝ විට උපුටා ගන්නේ,

(1) ඉතිහාස පොත් ය. (2) ශු. පාවුලු තුමාගේ හසුන් ය.
(3) දිවැසි ග්‍රන්ථය (4) නීති පොත් ය.

14. පැරණි ගිවිසුමේ ඇති එළිදරව්ව සාහිත්‍යයට අයත් ග්‍රන්ථයක් නම්,

(1) හිතෝපදේශය (2) 1 රාජාවලිය
(3) හබක්කුක් (4) දානියෙල්

15. රෝම අධිරාජ්‍ය තුළ එකල කිතුනුවන් හිංසා පීඩාවන්ට භාජනය කිරීමට හේතුව,

(1) ඔවුන් ආගමකට අයත් නිසා.
(2) අධිරාජ්‍යා දේවත්වයෙන් පිළි නොගැනීම නිසා.
(3) රජයට බදු ගෙවීම ප්‍රතික්ෂේප කළ නිසා.
(4) ඔවුන් අන්‍ය ජාතීන් වන නිසා.

16 ජේසුස් වහන්සේ අපෝස්තුලුවරුන්ට පව් කමා කිරීමේ බලය ලබා දුන්නේ කවදා ද?

(1) එම්මාවුස් ගමනේ දී ය.
(2) පාස්කු ඉරුදින සවස අපෝස්තුලුවරුන් වෙත වැඩම කළ අවස්ථාවේ දී ය.
(3) සබත් දිනයේ දී ය.
(4) පෙන්තකොස්ත දින දී ය.

17. ක්‍රිස්තුන් වහනසේ වෙනුවෙන් සාක්ෂි දැරීමට ඔබ කළ යුත්තේ,
(1) හැකි අවස්ථාවලදී වගකීම් ඉටු කිරීම.
(2) තාක්ෂණයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම.
(3) පරාර්ථකාමී ව අන් අයගේ සුභ සිද්ධිය උදෙසා වැඩ කිරීම.
(4) දැහැමි ක්‍රියා ප්‍රසිද්ධියට පත් කර ගැනීම.

18. "පෙන්තකොස්තය" යන වචනයේ අර්ථය වන්නේ,
(1) අස්වැන්න නෙලීම (2) ශුද්ධාත්ම ආගමනය
(3) පණහ (4) ශුද්ධ වූ සහාව

19. "පේදුරු" යන්නෙහි අර්ථය වන්නේ,
(1) ශක්තිය (2) වැඩිමලා
(3) යතුර (4) පර්වතය

20. ක්‍රියා පොතේ (9:1-9) සඳහන් ලෙස ශුද්ධ වූ පාවුලු තුමාට ප්‍රාසද ස්නාපනය දානය කළේ කවුරුන් විසින් ද?
(1) පේදුරු තුමා ය. (2) අනනියස් ය.
(3) ස්තේපන් තුමා ය. (4) ජේසු තුමා ය.

21. ............................ පීඩන සමයේ දී පාවුලු තුමාගේ හිස ගසා මරා දමනු ලැබුණි.
(1) දියෝක්ලිසස් අධිරාජ්‍යයාගේ (2) අගුස්තුස් අධිරාජ්‍යයාගේ
(3) ඩොමීෂියන් අධිරාජ්‍යයාගේ (4) නීරෝ අධිරාජ්‍යයාගේ

22. පාස්කුවෙන් පසු ජුදා ආගමිකයන්ගේ ප්‍රධාන මංගල්‍යය වූයේ,
(1) රොටි කැඩීමේ මංගල්‍යය (2) කූඩාරම් මංගල්‍යය
(3) පෙන්තකොස්ත මංගල්‍යය (4) නත්තල් මංගල්‍යය

23. තෝමස් අපෝස්තුලුවරයාට උත්ථාන වූ ජේසුස් වහන්සේ ව දර්ශනය වූයේ දින ................ පසුව ය.
(1) දෙකකට (2) හතරකට
(3) දහයකට (4) අටකට

24. කතෝලික ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය මෙන්ම අග්‍රස්ථානය හිමිවනුයේ,
(1) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ය. (2) දිව්‍ය පූජාවට ය.
(3) විශ්වාසලක්ෂණයටය. (4) ප්‍රසාද නිධානයන්ට ය.

25. "එබැවින් පරණ මුහුන්වලින් වත් ..................... සහ ............ නැමැති මුහුන්වලින් වත් නොව අවංකව ද සත්‍ය ද නැමැති නුමුහුන් රොටියෙන් පාස්කු මංගල්‍යය පවත්වමු" මෙහි හිස්තැන් පිරවීමට සුදුසු වචන පිළිවෙලින් දක්වූ විට,
(1) පළිගැනීම සහ එදිරිවාදිකම වේ. (2) වෛරය හා කේලම් කීම වේ.
(3) ඊර්ෂ්‍යාව සහ දුෂ්ටකම වේ. (4) ගැරහීම හා ක්‍රෝධය වේ.

26. ශුභාරංචි කතුවරුන් හතර දෙනාම වාර්තා කරන එකම ප්‍රාතිහාර්යය වන්නේ,
(1) අංශභාග රෝගියා සුවකිරීම ය.
(2) කානා නුවර මඟුල් ගෙදර වතුර වයින් කිරීම ය.
(3) පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යය ය.
(4) මාරුත දමනය කිරීම ය.

27. නව අහසට හා නව පොළොවට ඇතුළු වීමට අප කළ යුත්තේ,

A - පාපී ක්‍රියා අතහැර යාච්ඤා කිරීම.

B - ප්‍රේම කරන අයට පමණක් ප්‍රේම කිරීම.

C - පරිත්‍යාගයෙන් ජීවත් වීම.

D - දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම.

ඉහත පිළිතුරුවලින් නිවැරදි පිළිතුර වන්නේ,

(1) A, B සහ C ය. (2) A, B, සහ D ය.

(3) B, C සහ D ය. (4) A, C සහ D ය.

28. පාස්කු මංගල්‍යය සඳහා ජුදෙව්වෝ ගියේ කොහේට ද?

(1) ගලීලයට (2) ජෙරුසලම් දේව මාලිගයට

(3) පොරොන්දු දේශයට (4) නාසරතයට

29. ඒකත්වය යනුවෙන් අදහස් කරන්නේ,

A - ශු. සභාවේ ශුද්ධවත් බව

B - ශු. සභාවේ එකමුතුකම

C - ශු. සභාවේ ප්‍රචණ්ඩාන්වය

D - ශු. සභාවේ දියුණුව

(1) B ය. (2) C ය. (3) D ය. (4) A ය.

30. "ප්‍රසාද ස්නාපනය ලැබූ අය ජේසුස් වහන්සේගේ ...................... අවයවයෝ වෙති." හිස්තැනට අදාළ වන්නේ,

(1) දෙවියන් වහන්සේගේ දේහයේ

(2) පරම ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයේ

(3) ක්‍රිස්තුන් වහන්සේගේ ජනතාවගේ

(4) මුල් කිතුනු සභාවේ.

31. කතෝලිකත්වය යනුවෙන් අදහස් කරන්නේ,

(1) ශු. සභාවේ විශ්වීය බවයි. (2) ශු. සභාවේ එකමුතුකම යි.

(3) ශු. සභාවේ ශුද්ධවත් බවයි. (4) ශු. සභාවේ අනන්‍යතාවය යි.

32. "අපෝස්තුලුවරයා" යන්නෙන් අදහස් වන්නේ,

(1) තෝරා ගනු ලැබූ තැනැත්තා (2) යවනු ලැබූ තැනැත්තා

(3) මඟ පෙන්වනු ලැබූ තැනැත්තා (4) කැඳවනු ලැබූ තැනැත්තා

33. A - ජේසු නිකායික ධර්මදූතවරු

B - ෆ්‍රැන්සිස්කාන ධර්මදූතවරු

C - දොමිනිකාන ධර්මදූතවරු

D - අගුස්තීනු ධර්මදූතවරු

මේ අතරින් පෘතුගීසි සමයේ ලංකාවට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම ඇතුළත් වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

## ද මැසිනොද් විදුහල කඳාන

**දෙවන වාරය - 2019** 24.07.2019

**කතෝලික ධර්මය**

**10 ශ්‍රේණිය**

නම : .................................................................... කාලය පැය 2

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.

01) i. ශුද්ධවූ බයිබලයේ පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න.

ii. ශුද්ධවූ බයිබලයේ හසුන් වර්ගකරණ ප්‍රධාන කොටස් 02 මොනවාද?

iii. ද්විතීය පාවුළු සංදේශ 02 නම් කරන්න.

iv. පාස්කු අභිරහස යනු කුමක්ද?

v. මුල් කිතුණු සභාවේ ලක්ෂණ 04 ලියන්න.

vi. සාවුල්ට / පාවුලූට ප්‍රසාද ස්නාපනය ලබාදෙන ලද්දේ කවුරුන් විසින්ද?

vii. පේදුරු යන්නෙහි අර්ථය කුමක්ද?

viii. වර්තමාන ශුද්ධෝත්තම පියතුමා ශුද්ධවූ සභාව තුළ බිහිවූ කී වැනි ශුද්ධෝත්තම පියතුමා ද?

ix. ක්‍රිස්තුන් වහන්සේ මහා බ්‍රහස්පතින්දා දින ස්ථාපිත කළ සක්‍රමේන්තු මොනවාද?

x. ශ්‍රී ලංකාවේ වර්තමාන අගරදගුරුතුමන්ගේ නිල නාමය ලියා දක්වන්න.

(ලකුණු 2 X 10=20)

Learning Resource Center
R
De Mazenod College
Kandana

02) i. ශුද්ධවූ බයිබලයේ දේව වචනය අනාවරණයේ ප්‍රධාන මූලාශ්‍ර දෙක මොනවාද?

ii. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි අන්තර්ගතය ලියා දක්වන්න.

iii. බෞතිස්මය ලැබූ කිතුණුවකු ලෙස ඔබ ක්‍රිස්තුස් වහන්සේගේ ධර්ම දූත සේවාව ඉදිරියට ගෙනයන ආකාරය කරුණු 05 කින් විස්තර කරන්න.

03) i. ශුද්ධවූ පාවුලු තුමා හසුන් ලිවීමේ පරමාර්ථ 02 මොනාවද?

ii. ශුද්ධවූ පාවුළු තුමාගේ හසුන් වර්ගීකරණය කරන ප්‍රධාන කොටස් 03 මොනවාද?

iii. ශුභාරංචිය පතල කිරීමට ඔබ කටයුතු කරණ ආකාරය කරුණු 05 කින් ලියා දක්වන්න.

04) i. ශුද්ධවූ බයිබලයේ එළිදරවූ සාහිත්‍යයට අයත් ග්‍රන්ථ නම් කරන්න.

ii. එළිදරව් සාහිත්‍යයේ එන වර්ණ සංකේත 03 ක් ලියා ඒවායේ අර්ථය ද ලියාදක්වන්න.

iii. එළිදරව් සාහිත්‍යය හැරුණු විට කතෝලික පසුබිම තුළ ඔබට හමුවන සංකේත සලකුණු 05 ක් නම්කර ඒවායේ අර්ථයන් ලියා දක්වන්න.

05) i. ක්‍රිස්තුස් වහන්සේ කුරුසපත් කළ අවස්ථාවේ උන්වහන්සේ ගේ හිසට ඉහළින් තබන ලද පුවරුවේ සඳහන් කළ තිබූ (INRI) යන්නෙහි අර්ථය ලියා දක්වන්න.

ii. ආණ්ඩුකාර පිලාත් ඉදිරියේ ක්‍රිස්තුන් වහන්සේට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනා 03 කුමක්ද?

iii. ශුද්ධාත්ම ආගමනයෙන් පසු අපෝස්තුළුවරුන් නොබියව දේව වචනයට සාක්ෂි දැරූ ලෙස නව යොවුන් වියේ දරුවකු ලෙස ඔබ දේව වචනයට සාක්ෂි දරණ අවස්ථා 05 ක් ලියන්න

06) i. පේදුරු තුමාන්ට යතුරු හිමිකර දීමෙන් පැවරුණු ද්විත්ව බලතල මොනවාද?

ii. පේදුරු තුමන්ට පැවරුණු තුන් ප්‍රකාර කාර්යය භාර්යයන් මොනවද?

iii. ශුද්ධවූ සභාවේ අපෝස්තලිකත්වය යන්න කරුණු 05 කින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3+ = 10)

- පහත දැක්වෙන මාතෘකා අතරින් 02 ක් තෝරාගෙන ඒ සම්බන්ධව රූල් 10 කට නොඅඩු වන සේ කෙටි සටහන් ලියන්න.

  i. පළමු වන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා
  
  ii. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය
  
  iii. පුරාණ පාස්කු පිළිවෙත
  
  iv. ශු. ජුසේවාස් පියතුමා
  
  v. ශ්‍රී ලාංකික කතෝලික සභාවේ නිදහසින් පසු යුගය

(ලකුණු 5 X 2 = 10)